පටිච්චසමුප්පාදය (හත්වෙනි කොටස)
22.06.2019 - ශ්‍රී ලංකාරාමය
නවසීලන්තය

අපි භාවනා වැඩ සටහනේදී දවල් කාලයේදී සාකච්ඡා කිරීම් වශයෙන් මේ පින්වතුන්ට කියලා දෙන්නේ පටිච්චසමුප්පාදයේ කොටස්. පටිච්චසමුප්පාදය කියලා කියන්නේ හරිම ගැඹුරු ධර්මයක්. ඒ ගාම්භීර ධර්මය ගැඹුරුයි කියලා බුදුරජාණන්වහන්සේ නොදෙසා හිටියේ නෑ, දේශනා කළා. ඒ ගාම්භීර ධර්මය දැනගන්න අසාගන්න ඒ ගාම්භීර ධර්මය තේරුම් ගන්න access වෙන විදියක් තිබෙනවා. ඒ කියන්නේ ඒකට යන විදියක් තිබෙනවා. ඒ විදිය හරි පරෙස්සෙමෙන් line up කරගන්න ඕනෑ. පෙළගස්සා ගන්න ඕනෑ. එහෙම උනොත් තමයි ඕක තේරෙන්නේ. නැත්නම් තේරෙන්නේ නෑ. හේතුව, බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තිබෙනවා මේක නූල් බෝලයක් වගේ අවුල්වෙලා තිබෙන්නේ කියලා. ඉතින් එහෙම විසිරිලා අවුල්වෙලා තිබෙන දේ තේරුම් ගැනීමට අපිට එක පිළිවෙලක් අනුගමනය කරන්න ඕනෑ. ඒ පිළිවෙල බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තිබෙනවා, ඒ පිළිවෙලට තමයි මේක වෙන්නේ කියලා.

අපි පටිච්චසමුප්පාදය කියලා දෙනකොට ඒ පිළිවෙලට තමයි කරුණු කාරණා කියලා දෙන්නේ. ඒත් හිතන්න හොඳ නෑ ඔක්කෝම හැම එක්කෙනාටම තේරෙනවා කියලා. තේරෙනවා නම් හොඳයි. ඒක භාග්‍යයක්. ඒක වාසනාවක්. මේ වචන නම් තේරෙනවා නමුත් ඒකෙන් කියලා දෙන දේ මොකක්ද කියන එක තමයි ප්‍රශ්නය.

මොකක්ද පටිච්චසමුප්පාදය කියන්නේ? පටිච්චසමුප්පාදය කියලා කියන්නේ හේතුවෙන් ඵලයක් ඇතිවෙන ක්‍රමය. හේතුවක් නිසා ඵලයක් ඇතිවෙනවා කියන එක. පටිච්චසමුප්පාදයේ අංග කීයක් තිබෙනවාද? පටිච්චසමුප්පාද links හෙවත් අංග 12 ක් තිබෙනවා. (අවිජ්ජා - සඞ්ඛාර - විඤ්ඤාණ - නාමරූප - සළායතන - ඵස්ස - වේදනා - තණ්හා - උපාදාන - භව - ජාති - ජරාමරණ). හොඳට බලන්න, මේ කියාගෙන යන වට්ටෝරුවෙන් මේ අංග 12 න් අපිට ටිකක් වැඩිපුර තේරෙන්නේ මොකක්ද? ජරා මරණ තේරෙනවා. අනිත් එක තමයි තණ්හාව තේරෙනවා. නමුත් වැඩියෙන්ම අහුවෙන්නේ ජරාමරණ. අපි මළගෙවල් වලට යනවා, ලෙඩ්ඩු බලන්න යනවා, කොන්ඩේ ඉදෙනවා පැහෙනවා, වයසට යනවා අබල දුබල වෙනවා. මේවා ප්‍රකටයි. ඒකනිසා ජරාමරණ දෙක හරි පැහැදිලිව තේරෙනවා. නමුත් උප්පතිය තේරුම් ගන්න අමාරුයි. භව තේරුම් ගන්න අමාරුයි. උපාදානය අමාරුයි. තණ්හාව නම් ඇඳුම් පැළඳුම් වලටවත් ලෝභ කරනවා කියලා යන්තම් හරි හිතේ වද්ද ගන්න පුළුවන්. වේදනාවෙත් සමහර ඒවා තේරෙනවා නමුත් ගැඹුරින්ම තේරෙන්නේ නෑ. ස්පර්ශයත් හරි සියුම්. ආයතනත් තෙරුම් ගන්න හරි අමාරුයි. සංඛාරත් තෙරුම් ගන්න අමාරුයි. අවිද්‍යාවත් තේරුම් ගන්න හරිම අමාරුයි. වචන නම් පාලි භාෂාව කියලා තේරෙනවා. ඒවගේම විඤ්ඤාණයත් තේරුම් ගන්න හරි අමාරුයි.

අපි ගිය මාසේ කථා කළා පටිච්චසමුප්පාදයේ එක්තරා කොටසක්. ඒ තමයි **විඤ්ඤාණ පච්චයා නාමරූපං** කියන තැන. විඤ්ඤාණ පච්චයා නාමරූපං = විඤ්ඤාණයේ හේතුවෙන්

විඤ්ඤාණය ප්‍රත්‍යය වීමෙන් නාම රූප ධර්මයෝ ඇතිවෙනවා හටගන්නවා කියන එක තමයි ඒකෙන් කියන්නේ. ඒ නාම මොනවාද රූප මොනවාද කියලා මම කියලා දුන්නා. මේ කාරණය හරිම පරෙස්සමෙන් තේරුම් ගන්න. මේ කථාව නැවත නැවත අහලා හිතලා මෙනෙහි කරලා තේරුම් ගන්න ඕනෑ. මේක ලේසියෙන් මතක හිටින්නේ නෑ. මේක ගැඹුරුයි.

විඤ්ඤාණ පච්චයා නාමරූපං කියලා කියනකොට මේ මනුස්සලෝකයේ අපි උපදිනකොට ඉස්සරවෙලාම සත්වයෙක් කියලා මවුකුසකට ආවේ විඤ්ඤාණය. නමුත් ඒ විඤ්ඤාණයට අපි නමක් දානවා. ඉස්සරවෙලාම මවු කුසකට උදේ කාලයේ හෝ වේවා රාත්‍රියේ හෝ වේවා දවල් හෝ වේවා සවස හෝ වේවා කොයියම් වේලාවක මව් කුසක හටගන්නේ විඤ්ඤාණයක්. ඒ විඤ්ඤාණය මවුකුසේ සත්වයෙක් හැටියට ඉස්සරවෙලාම හටගන්නා හින්දා ඒකට අපි පොඩි adjective එකක් දානවා ප්‍රතිසන්ධි විඤ්ඤාණය කියලා. ඒ ප්‍රතිසන්ධි විඤ්ඤාණය සංසාරයේ අලුතින් පටන් ගන්න එකක් නොවෙයි. වෙන කොහෙන් හරි මැරිච්ච එක්කෙනුකුගෙන් අහක් වෙලා ආපු එකක්. කොහේ හරි මැරිච්ච කෙනෙකුගේ ගැලවිලා ඒ ඉස්සෙල්ලා ශරීරය පැත්තකට දාල ඒකෙන් අහක්වෙලා ආපු විඤ්ඤාණය තමයි ප්‍රතිසන්ධි විඤ්ඤාණය වෙන්නේ. මේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය පවතින්නේ ක්ෂණයයි. ප්‍රතිසන්ධි විඤ්ඤාණය ක්ෂණයක් තිබිලා නැති වෙච්ච ගමන්ම ඒ ප්‍රතිසන්ධි විඤ්ඤාණයේ හැඩයට තව හිත් පහළ වෙනවා. ඒ සිත්වලට කියනවා භවාංග සිත් කියලා. මේ සිත් එකින් එකට ගැවිලා තිබෙන්නේ. ඒක නිසා අපිට වෙනම වෙනම හිත් වශයෙන් දැනෙන්නේ නෑ. අපිට හිතෙන්නේ එකම හිතක් එහෙට මෙහෙට හැරි හැරී යනවා කියලා.



මවුකුසේ ඉස්සෙල්ලාම පහළවෙන සිත ප්‍රතිසන්ධි සිත වෙනවා. ඊළඟට පහළවෙන සිත් භවාංග සිත් වෙනවා, ප්‍රතිසන්ධියෙන් පසු මැරෙනතාක්ම වර්තමාන කාලයේ එක දිගට එක flow එකකට පවතින මේ සිත් වලට ප්‍රවෘත්ති සිත් කියලා කියනවා. මේවාට එක එක නම් තිබෙනවා. ඒවාට විපාක සිත් කියනවා. ප්‍රවෘත්ති සිත් කියනවා. භවාංග සිත් කියනවා.

මේ නම් නිසා සමහරවිට අවුලකුත් හැදිලා තිබෙනවා. නමුත් මේ නම් නැතුවත් අපිට මේක තේරුම් ගන්න බෑ. දැන් අපි හිතමු මෙහෙම. රංජිත් කියලා මනුස්සයෙක් ඉන්නවා. ඔය මනුස්සය truck එකක් එළවනවා. එතකොට එයාට truck driver කියලා කියනවා. එයා කාන්ති කියලා මනුස්සයෙක්ව විවාහ කරගෙන ඉන්නවා. එතකොට එයා කාන්තිගේ

husband වෙනවා. එයා මරණාධාර සමිතියේ සභාපතිත් වෙනවා. එයාට ඉන්නවා පොඩි දරුවෙක්. එතකොට එයා තාත්තා වෙනවා. දැන් අපි හිතමු මේ මනුස්සයා යනවා යම් කිසි උත්සවයකට. එතකොට එක්කෙනෙක් මෙයාව දැකලා කියනවා 'truck driver ඇවිල්ලා ඉන්නවා' කියලා. තව එක්කෙනෙක් කියනවා 'අන්න අර ළමයාගේ තාත්තා ඇවිල්ලා ඉන්නවා' කියලා. ඊට පස්සේ තව එක්කෙනෙක් කියනවා 'අන්න කාන්තිගේ මහත්තයා ඇවිල්ලා ඉන්නවා' කියලා. තව එක්කෙනෙක් කියනවා 'රංජිත් ඇවිල්ලා ඉන්නවා' කියලා. තව එක්කෙනක් කියනවා 'අන්න අපේ president ඇවිල්ලා' කියලා. නමුත් මේ කථා ඔක්කොම ඇත්ත. කොහොමද මේ හැම එකක්ම ඇත්ත වෙන්නේ? ඒකට හේතුව මෙයා එක මනුස්සයා උනාට එයා නිරූපණය කරන්නාවූ හැකියාවන් සහ එයාට ලැබිලා තිබෙන්නා වූ දේවල් එකක් නොවෙයි. ඒක නිසා එයා හඳුන්වා දුන් විදි ඔක්කොම හරි.

ඒවගේ අපි භවාංග සිත කියනවා. ඒකටම විපාක සිත කියලා කියනවා. ප්‍රවෘත්ති සිත කියලත් කියනවා.

1) **භවාංග සිත** = ප්‍රතිසන්ධියෙන් පස්සේ දිගට flow වෙන්නාවූ සිත් වලට භවාංග සිත් කියලා කියනවා.
2) **විපාක සිත** = ඒ භවාංග සිත ඉස්සෙල්ලා කරපු කර්මයක විපාකයක් හැටියට flow වෙන නිසා කියනවා විපාක සිත කියලා.
3) **ප්‍රවෘත්ති සිත** = ඉපදුනාට පස්සේ වර්තමාන කාලයේදී (පවතින කාලයේ) ඇතිවෙන සිත් නිසා කියනවා ප්‍රවෘත්ති සිත් කියලා.

අද එතකොට අපි කියාගෙන යන්නේ **විඤ්ඤාණ පච්චයා නාමරූපං** කියන එක ප්‍රවෘත්ති කාලයේ. තවත් එකක් තමයි අපේ අයට පටලැවෙන වචන තුනක් තිබෙනවා. ඒ තමයි හිත විඤ්ඤාණය සහ මනස. හේතුව, මේ නම් තුනෙන්ම අමතන්නේ එක ධර්මයක්. මේ හිතට තිබෙනවා එක්තරා හැකියාවන්. හිතීමේ ගතිය හිතට තිබෙන නිසා කියනවා **හිත** කියලා. අරමුණක් දැන ගැනීමේ ගතිය හිතට තිබෙන නිසා කියනවා **විඤ්ඤාණය** කියල. චෛතසික ආදී අනිත් ධර්ම වලට ප්‍රධාන කාරණයක් වෙන නිසා කියනවා **මන** කියලා.

අපි ගිය අවස්ථාවේදී ප්‍රතිසන්ධි විඤ්ඤාණය ගැන කිව්වා. ප්‍රතිසන්ධි විඤ්ඤාණයක් හටගත්තේ නැත්නම් ප්‍රතිසන්ධි විඤ්ඤාණයක් මවුකුසට ආවේ නැත්නම් අපිට මේ අතක් පයක් ඇඟක් කටක් බඩක් තිබෙනවද? නෑ. ප්‍රතිසන්ධි විඤ්ඤාණය හින්දම තමයි මේ රූප හැදුනේ. ප්‍රතිසන්ධි විඤ්ඤාණය හින්දම තමයි ඔය වේදනාවල් දැනෙන්නේ සංඥාවල් සංඛාර හැදෙන්නේ. ප්‍රතිසන්ධි විඤ්ඤාණය නැත්නම් ඒ මොකක්වත් හැදෙන්නේ නෑ. ඒකනිසා කියනවා විඤ්ඤාණය නිසා නාම හැදුනා, විඤ්ඤාණය නිසා රූප හැදුනා කියලා. ඒකට කියනවා **විඤ්ඤාණ පච්චයා නාමරූපං** කියලා.

මේ විඤ්ඤාණ පච්චයා නාමරූපං කියලා කියන කථාවේ තිබෙනවා පටන් ගැනීමේ හිත සහ පවතින හිත. ඒ දෙකට තමයි කියන්නේ ප්‍රතිසන්ධි හිතයි ප්‍රවෘත්ති හිතයි කියලා. දැන් අපිට තිබෙන්නේ පවතින හිතක්. අපි ඔක්කෝගෙම ප්‍රතිසන්ධි සිත් පහළ උනේ ලංකාවේ කොහේ හරි තැනක. අපිට දැන් තිබෙන්නේ ප්‍රවෘත්ති සිත්.

මේ ප්‍රවෘත්ති සිත් ඔක්කෝම විපාක නොවෙයි. අපි කර්මත් කරනවා. අපි ඇස් වලින් එක එක රූප දකිනවා. එතකොට ඒ රූප අරමුණු අපේ ඇහැට ගොදුරු වෙනවා. ඇහැට රූප දැනගන්න බෑ. මේ වට පිටාවේ තිබෙන දේවල් ඇහේ හැප්පෙන එක විතරයි කරන්නේ. වටපිටාවේ තිබෙන දේවල් ඇසේ හැප්පුනහම ඒක දැන ගන්නේ විඤ්ඤාණයෙන්. ඒකට හිත අවශ්‍යයි. නමුත් හිතට රූප දැනගැනීම සඳහා ඇස හරහා යන්නේ නැතුව ඒක bypass කරලා යන්න බෑ. විඤ්ඤාණය කියන එක ඇස තුලින්ම ගිහිල්ලා රූපයට වදින්න ඕනෑ. කවදාකවත් ඇස තුලින් යන්නේ නැතුව හිත කන පැත්තෙන් ගිහිල්ලා රූපයට යන්නේ නෑ. Bypass කරන්නේ නෑ, හොර පාරවල් නෑ. ඒක නිසා විඤ්ඤාණය ඇස තුලින්ම ගිහිල්ලා රූපය දැනගන්න හින්ද ඒකට කියනවා **චක්ඛු විඤ්ඤාණය** කියලා.

ඊට පස්සේ සද්දය දැන ගන්න කනට බෑ. විඤ්ඤාණයටයි පුළුවන්කම තිබෙන්නේ. දැනගැනීමේ ශක්තිය තිබෙන්නේ කනට නොවෙයි. දැන ගැනීමේ ශක්තිට තිබෙන්නේ විඤ්ඤාණයට පමණයි. ඒක නිසා විඤ්ඤාණය කන හරහා ගිහිල්ලා සද්දය දැනගන්නවා. සද්දය දැන ගැනීම සඳහා කන කියන එක ආධාරකයක් විතරයි.

මේ වගේම තමයි නාසයත්. මේ වගේම තමයි දිවත්. ඒවගේම තමයි ශරීරයත්.

මේ විඤ්ඤාණ කියන ඒවා 5 ක් තිබෙනවා. ඒ පහ තමයි චක්ඛු විඤ්ඤාණය. ඒකෙන් රූප දැනගන්නවා. සෝත විඤ්ඤාණය සද්ද දැනගන්නවා. ඝාණ විඤ්ඤාණය ගඳ සුවඳ දැනගන්නවා. ජිව්හා විඤ්ඤාණය රස දැනගන්නවා. කාය විඤ්ඤාණය ස්පර්ශ දැන ගන්නවා. දැන් මේ කියන්නා වූ විඤ්ඤාණ වර්ග 5 පහළ වෙන්නේ ප්‍රවෘත්ති කාලයේ. මේ විඤ්ඤාණ ‘විපාක’ වශයෙන් වැඩ කරන ඒවා. තවත් තිබෙනවා විපාක වශයෙන් වැඩ කරන සම්පටිච්ඡන සන්තීරණ ආදී සිත්. මේ සිත් ප්‍රවෘත්ති කාලයේ පහළ වෙන සිත්. මේවාට කියනවා විපාක සිත් කියලා.

මේ ධර්ම ශාලාවේ ලස්සනට පාට ගාලා තිබෙන්නා වූ මේ ඔක්කොම ටික පෙන්නේ අපේ ඇහැට. ඒ හදපු මිනුස්සුන්ගේ කර්ම වලින් තමයි මේවා හදලා තිබෙන්නේ. නමුත් අපි තමයි මේකේ ඉඳගෙන මේවා බලාගෙන ඉන්නේ. අපේ තමයි විපාකය. මේ විපාක අපිට ලැබෙන්නේ පෙර ජීවිතවල කරලා තිබෙන්නා වූ කර්ම ශක්තියක බලයෙන්. දැන් විපාකයක් විදියට තමයි අපිට මේවා හම්බවෙන්නේ. ඊළඟට ඔය මිනිස්සු හඳුන්කූරු පත්තු කරලා යනවා. සුවඳ දැනගන්නේ අපි. ඒ ගොල්ලන්ගේ කර්ම, අපේ විපාක. ඒවගේම මිනුස්සු මල් පූජා කරලා යනවා. දැන් අද දවල් දානය දීලා ගියා මිනිස්සු. එතකොට මේ පින්වතුන් දානය දැක්කා ඇසෙන්, ප්‍රියයි. ඒ චක්ඛු විඤ්ඤාණ. දානය හොඳ ප්‍රණීතයි. නාසයට සුවඳත් තිබුණා, ඝාණ විඤ්ඤාණ පහළ උනා. දානය රසයි, ජිව්හා විඤ්ඤාණ පහළ උනා. මට සිලිටුයි, හොඳ කාය විඤ්ඤාණ පහළ උනා. ඒ වර්ණය සද්දය ගන්ධ රස ස්පර්ශ ඔක්කෝම මේ පින්වතුන්ගේ ඇසට කනට නාසයට දිවට ශරීරයට ලැබුණා. ඒ පහළ උනේ මේ හැම එක්කෙනාගේම ප්‍රවෘත්ති කාලේ පහළවෙන විපාක විඤ්ඤාණ. දානේ දීපු අය රැස්කළේ කුසල කර්ම. මේ පින්වතුන් විපාක වින්දා. එතකොට ප්‍රවෘත්ති කාලේ කර්මත් වෙනවා විපාකත් ලැබෙනවා.

විපාක සිත් හැරුනහම **අවිපාක සිත්** කියලා තවත් සිත් වර්ගයක් තිබෙනවා. අවිපාක සිත් කියන්නේ කර්ම සිත්වලට. දැන් අපි බණ අහනකොට ඒ ඇහෙන සද්දය විපාකයක්. බණ මෙනෙහි කරනකොට හැදෙන්නේ කර්ම. එතකොට තිබෙන්නේ පරණ කර්මයක විපාකයකුයි දැන් කරන කර්මයකුයි.

දැන් **විඤ්ඤාණ පච්චයා නාමරූපං** කියන එක තේරුම් ගන්න.

- ඉස්සෙල්ලාම **ප්‍රතිසන්ධි විඤ්ඤාණය** ඇතිවෙනවා.

විඤ්ඤාණය (සිත) — ප්‍රතිසන්ධි විඤ්ඤාණය

නාම — වේදනා
සංඥා
සංඛාර

රූප — සියලු රූප = (පඨවි ආපෝ තේජෝ වායෝ
චක්ඛු සෝත ඝාණ ආදී රූප)

මේ නාම සහ රූප සියල්ලම පහළ වෙන්නේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිසා. විඤ්ඤාණයක් නැත්නම් ඒවා පහළ වෙන්නේ නෑ. අපිට මේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය ඇති උනාට පස්සේ තමයි ඇඟ කකියන ඒවා, කසන ඒවා, ඔලුවේ ආමාරු වගේ වේදනාවල් ඔක්කෝම ආවේ.

- ඊළඟට **ප්‍රවෘත්ති විඤ්ඤාණය.** අපි හිතමු අපිට ලස්සන බුදුපිළිම වහන්සේ නමක් පේනවා කියලා. ඒක කුසල විපාක සිතක්. එතකොට ඇතිවෙන්නේ චක්ඛු විඤ්ඤාණ.

ප්‍රවෘත්ති විඤ්ඤාණය

විඤ්ඤාණය — චක්ඛු විඤ්ඤාණය / චක්ඛු (රූප)

නාම — වේදනා
සංඥා
සංඛාර

විඤ්ඤාණ පච්චයා නාමරූපං

චක්ඛු විඤ්ඤාණ සිත 'විඤ්ඤාණය' වෙනවා. චක්ඛු විඤ්ඤාණයේ තිබෙන වේදනාව සංඥාව සහ සංඛාර 'නාම' වෙනවා. මෙතැනදීත් විඤ්ඤාණය නිසා නාම ඇතිවෙනවා. මේ සිත නිසා රූප පහළ වෙන්නේ නෑ. නමුත් තව ඉස්සරහට යනකොට පහළ වෙන සම්පටිච්ඡන ආදී සිත් රූපත් එක්ක පහළවෙනවා.

තව එකක් තමයි චක්ඛු විඤ්ඤාණය ගන්න කොට රූප හොයන්නේ වෙන විදියකට. මේ චක්ඛු විඤ්ඤාණය පහළ වෙන්නේ නෑ, ඇස කියන එක නැත්නම්. ඒක නිසා චක්ඛු විඤ්ඤාණයට තිබෙන්න ඕනෑ අනිවාර්යම අංගයක් තමයි ඇස. ඇස කියලා කියන්නේ රූපය. එතකොට නාමත් තිබෙනවා රූපත් තිබෙනවා. මේ චක්ඛු විඤ්ඤාණය ප්‍රවෘත්ති වශයෙන් පහළ වෙන්න ආධාර කරගන්නේ ඉස්සෙල්ලා පහළ වෙච්ච චක්ඛු රූපය. ඒ එක්කම පහළ වෙනවා නාම ධර්ම ටික.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ඇසයි රූපයයි දෙකම රූප ගණයටද අයිතිවෙන්නේ?

<u>පිළිතුර</u> - මෙහෙමයි තිබෙන්නේ, රූපය නිසා විඤ්ඤාණය පහළ වෙනවා කියලා අපි කිව්වාට එකම වේලාවේ රූපයයි විඤ්ඤාණයයි ආරම්මණයයි තුන එක්වීමක් තමයි වෙන්නේ. ඒ කියන්නේ බාහිර රූපයයි - ඇසයි - හිතයි කියන තුන්දෙනා එක වේලාවක එක්කාසුවක් වෙනවා. ඒ එක්කාසුව වීමේදී විඤ්ඤාණය කලින් හරි රූපය කලින් හරි ආරම්මණය කලින් හරි නොවෙයි, එකම වේලාවට මේ තුදෙනා එක්කාසු වෙනවා.

ඒක විස්තර කරනකොට කියනවා **චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං** කියලා. හැබැයි වෙන්නේ එක වෙලාවේදීම ඒ තුන්දෙනා එකට පහළ වීමක්. **තිණ්ණං සඞ්ගති ඵස්සො** = තුන්දෙනාගේම එකතු වීම ස්පර්ශයයි කියල කියනවා. ඒ කියන්නේ එක්කාසු වීම වශයෙන්.

විඤ්ඤාණ පච්චයා නාමරූපං කියලා මෙතැනදී විශේෂයෙන්ම කියන්නේ විපාක විඤ්ඤාණය නිසා නාම සකස් වෙන විදියයි විපාක විඤ්ඤාණය නිසා රූප සකස් වෙන විදියයි. මෙතැනදී තිබෙන විශේෂය තමයි සාමාන්‍යයෙන් සිත නිසා පහළ වෙන චිත්තජ රූප මේ චක්ඛු විඤ්ඤාණය නිසා පහළ වෙන්නේ නෑ. නමුත් ඉස්සරහදි පහළවෙන සම්පටිච්ඡන සිතේ සන්තීරණ සිතේ ආදී සිත්වල පහළ වෙනවා.

නැවතත් අපි රූප පැත්තට හැරෙමු. සියලුම රූප තිබෙනවා 28ක්.

භූතරූප	4	පඨවි - ආපෝ - තේජෝ - වායෝ
ප්‍රසාද රූප පස	5	චක්ඛු ප්‍රසාදය - සෝත ප්‍රසාදය - ඝාණ ප්‍රසාදය - ජිව්හා ප්‍රසාදය - කාය ප්‍රසාදය
ගෝචර රූප	5	රූප - ශබ්ද - ගන්ධය - රස - *ස්පර්ශ
භාව රූප	2	ඉත්ථි රූපය - පුරුෂ රූපය
හෘදය වත්ථු රූපය	1	
ජීවිත රූපය	1	
ආහාර රූපය	1	
ආකාස රූපය	1	
විඤ්ඤත්ති රූප දෙක	2	කායවිඤ්ඤත්ති රූපය - වචී විඤ්ඤත්ති රූපය
විකාර රූප තුන	3	ලහුතා රූපය - මුදුතා රූපය - කම්මඤ්ඤතා රූපය
ලක්ෂණ රූප සතර	4	උපචය - සන්තති - ජරතා - අනිච්චතා

(***ස්පර්ශය** කියන තැනත් පඨවි - තේජෝ - වායෝ යන භූත රූප තුන තිබෙන බැවින් රූප 28 ගණන් කිරීමේදී ස්පර්ශය අත්හැර ගණන් කල යුතුයි).

මේ රූප 28 න් ප්‍රධාන රූප හැටියට, මහා රූප හැටියට භූත රූප හැටියට ගණන් ගන්න රූප 4ක් තිබෙනවා. ඒ මහා භූත රූප ආධාරකරගෙන ඒවා භූමිය කරගෙන පවතින්නා වූ අනිත් රූප ගති 24 ට කියනවා **උපාදාය රූප** කියලා. ඔක්කොම රූප 28 වෙනවා.

මේ රූප 28 තිබෙනවා භාව රූප කියලා රූප දෙකක්. මේ භාව රූප කියන රූප ලොකු ඒවා නොවෙයි. ඒවා අතිශය සූක්ෂම වෙච්ච ගති ස්වභාව ටිකක්. අනිත් රූප වල තැවරිලා ඇතිල්ලිලා පැතිරිලා තිබෙන ඒවා භාව රූප කියලා කියන්නේ. මේ ස්ත්‍රී භාව රූපය සහ පුරුෂ භාව රූපය කියන ගති දෙක හිසේ කෙස් වල පටන් නියපොතුවල පටන් හැම තැනම තැවරිලා ඇතිරිලා පැතිරිලා පවතිනවා සියුම් විදියට. මේ රූප දෙක මුළු රූප 28 න් දෙකක් පමණයි. ස්ත්‍රී කෙනෙකුගේ ශරීරයේ ස්ත්‍රී භාව රූපය මිස පුරුෂ භාව රූපය නෑ. පුරුෂයකුගේ ශරීරයේ ස්ත්‍රීභාව රූප පිහිටන්නේ නෑ. ඒක නිසා යම්කිසි කෙනෙකුගේ ශරීරයේ පිහිටන්නේ රූප 27 ක් පමණයි.

යම් කිසි මනුස්සයෙකුගේ ඇස් පෙන්නේ නැත්නම් ඒ කියන්නේ එයාගේ චක්ඛු ප්‍රසාද රූපය නෑ කියන එකයි. එතකොට ඇස් පේන්නේ නැති කෙනෙකුගේ තිබෙන්නේ රූප 26යි. ඒ මනුස්සයාගේ කන් ඇහෙන්නෙත් නෑ කියන්නේ තවත් රූපයක් අඩුයි කියන එක. එතකොට එයාට තිබෙන්නේ රූප 25යි.

දැන් මේ බඹයක් පමණ ශරීරය තුල පහළවෙන රූප, විධි 4 කට ආකාර 4 කට පහළ වෙනවා කියලා මම කියලා දුන්නා. ඒ තමයි පෙර කරපු කර්මයක් නිසා පහළ වෙච්ච රූප තිබෙනවා. චිත්තය නිසා පහළ වෙන රූප තිබෙනවා. ඍතුව නිසා පහළ වෙන රූප තිබෙනවා, අනිත් එක තමයි ආහාර නිසා පහළ වෙන රූප තිබෙනවා.

කර්මයෙන් පහළ වෙන රූප වලට කියනවා **කර්මජ රූප** කියලා. සිත නිසා පහළවෙන රූප වලට කියනවා **චිත්තජ රූප** කියලා. ඍතුව නිසා පහළවෙන රූප වලට කියනවා **ඍතුජ රූප** කියලා. ආහාර නිසා හැදෙන රූප වලට කියනවා **ආහාරජ රූප** කියලා. මේ රූප වර්ග හතරම මේ ශරීරයේ එකට එතිලා පැටලිලා එකට මිශ්‍රවෙලා තමයි තිබෙන්නේ. මේ හතරෙන් priority එක තිබෙන්නේ කර්මජ රූප වලට. කර්මජ රූප හැර අනිත් සියලුම රූප කර්මජ රූප වලට support කරන රූප.

ඒක අපි මෙහෙම තේරුම් ගනිමු. මනුස්සයෙක් එළිමහනේ අව්ව තිබෙන පරිසරයක barbecue type එකේ business එකක් කරනවා. එයා මෙහෙම වැඩක් කරනවා. ඒ තමයි වඩේ බදිනවා. එයා තෙල් තාච්චියට වඩේ එක දාල හොඳට බදිනවා. ඒකෙ තිබෙනවා රස්නයක්. ඊට පස්සේ එයා ඒ තෙල් තාච්චියේ බැදිච්ච වඩේ එක අරගෙන රත් වෙච්ච තැටියකට දානවා. වඩේ එක බැදුනේ උණු තෙල් වල. ඊට පස්සේ එයා ඒක බැදලා දැම්මේ උණු තැටියකට. ඊළඟට එයා ඒක අව්වේ තියනවා. හොඳට හිතලා බලන්න, අව්ව සීතලද? රස්නෙද? රස්නෙයි. එතකොට අර තැටිය සීතලද රස්නෙද? රස්නෙයි. එතකොට තෙල් සීතලද රස්නෙද? රස්නෙයි. එතකොට මෙතැන තිබෙනවා රස්න වර්ග තුනක්. එකක් තමයි වඩේ එක බැදිච්ච තෙල් වල රස්නය. අනිත් එක තමයි තැටියේ තිබෙන රස්නය. අනිත් එක තමයි අව්වේ රස්නය. මේ රස්න තුනම ලැබෙන්නේ එක වඩේ එකට. එතකොට ඒ එක වඩේ එකේ උණුහුම් ගති තුනක් තිබෙනවා. ඒ උණුහුම් ගති තුන ඒ වඩේ එකට ආවේ එක තැනකින්ද තැන් තුනකින්ද? තැන් තුනකින්. රස්නය එක උනාට ඒක ආවේ පැති තුනකින්. එකක් තෙල් වලින් ආවා. එකක් තැටියෙන් ආවා. අනිත් එක අව්වෙන් ආවා.

මෙහෙමත් හිතන්න. කෙනෙකුට තරහ යනවා. එතකොට අපි කියනවා ලේ කුපිත වෙනවා, ලේ රත් වෙනවා කියලා. තරහ ගියහම ලේ ගමන වැඩියි. ලේ ගමන වැඩි වෙන්නේ තරහ සිත නිසා රත්වීම වැඩි නිසා. එතකොට pressure එකත් එහෙට මෙහෙට යනවා. දැන් වතුර උතුරන්නේ මොකක් නිසාද? වතුර උතුරන්නේ රත් වෙච්ච නිසා. ඒවගේ ලේත් රත් උනහම වැඩියෙන් pump වෙනවා. ඒවගේ තරහ ගිය මනුස්සයාගේ හිත රත් උනා. ඇඟ රත් උනා. එතකොට ඒ මනුස්සයාගේ ඇඟේ රස්නයක් තිබෙනවා. සමහර අයට දාඩියත් දානවා. ඒ වෙලාවට එයා රස්නෙන් තේ එකක් බොනවා. එතකොට ඒ මනුස්සයගේ ඇඟේ රස්නෙයි තේ එකෙන් එන රස්නෙයි රස්න දෙකයි. ඊළඟට එයා ඇවිල්ලා heater එකක් ළඟ

ඉන්නවා. එතකොටත් එයාට රස්නයක් දැනෙනවා. එතකොට රස්න තුනක් තිබෙනවා. ඒ රස්න තුන ඒ මනුස්සයට එන්නේ විධි තුනකින්. එක රස්නයක් self-generated. අනිත් රස්නය තේ එකෙන් ඊළඟ එක heater එකෙන්.

ආන්න ඒවගේ මේ ශරීරය ඇතුලේ තිබෙන්නා වූ රූප, විධි තුනකටයි පහළ වෙන්නේ. මේ සියලුම රූප එකට මිශ්‍ර වෙලා තිබෙන්නේ, ඒවා වෙන්කරන්න බෑ. නමුත් අපි තේරුම් ගතයුතුයි මේ පහළ වෙලා තිබෙන රූප අපේ ශරීරයේ පහළ වෙලා තිබෙන්නේ ආකාර හතරකට කියලා (කර්ම - චිත්ත - ඍතු - ආහාර).

ඉස්සෙල්ලා කෙනෙක් චිත්තජ රූප ගැන කිව්වා. ඒ චිත්තජ රූප කියලා කියන්නේ තරහ යනකොට ඇතිවෙන්නා වූ පහළ වෙන්නා වූ රූප. තරහ කියලා කියන්නේ තරහ සිත. ඒ තරහ සිතත් එක්ක පහළවෙනවා වේදනාව සංඥාව සංඛාර. ඒ සිතෙන් පහළ කරන්නා වූ රූපත් තිබෙනවා. ආන්න ඒවාට කියනවා **නාම - රූප** කියලා.

මේ තමයි විඤ්ඤාණයක් නිසා නාම හැදෙන විදිය සහ විඤ්ඤාණයක් නිසා රූප හැදෙන විදිය.

- ඊළඟ එක තමයි නාම රූප නිසා සළායතන හැදෙන විදිය.

වේදනා
සංඥා } නාම
සංඛාර

නාමරූප පච්චයා සළායතනං

පඨවි
ආපෝ
තේජෝ
වායෝ
චක්ඛු
සෝත
ඝාණ
ජිව්හා
කාය
වත්ථු රූපය
ජීවිත ඉන්ද්‍රිය
රූපය

(පඨවි … රූපය) } රූප

සළායතන { චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, වත්ථු රූපය

මේ අතරින් සළායතන කියලා කියන්නේ චක්ඛු - සෝත - ඝාණ - ජිව්හා - කාය - වත්ථු රූපය කියන රූපවලට. මේ චක්ඛු ප්‍රසාද කියන රූපය පහළ උනහම යම් කිසි වෙලාවක ආයතන වැඩේ කරන්න සුදුසු අවස්ථාව වෙනකම් ඒක ප්‍රසාදයක් ලෙස පවතිනවා.

මේක මේ විදියට තේරුම් ගන්න.

පිටි නිෂ්පාදනය කරලා බෑග් එකකට දාල තිබෙනවා. ඒ පිටි යම්කිසි අවස්ථාවකදී ඒකට අවශ්‍ය සෝඩා වර්ග ඇතුළු අනිත් දේවල් එකතුවෙලා ක්‍රියාත්මක උනහම ඒක පාන් ගෙඩියක් බවට පත්වෙනවා. ඒ අනුව පාන් ගෙඩියක් වීමට සුදුසු කම තිබෙනවා පිටිවල. එතකොට අපි පාන් වශයෙන් කන්නෙත් පිටිමයි. ඒ පාන් හැදෙන්න ඕනෑ ගුණය ශක්තිය පිටි වශයෙන් තිබෙනවා. එතකොට අපි පාන් පිටි කන්නේ පාන් නමින්.

දැන් හැම එක්කෙනාගේම ශරීරයේ ඇසක් තිබෙනවා, කනක් තිබෙනවා, නාසයක් තිබෙනවා, දිවත් තිබෙනවා, කයක් තිබෙනවා. (මේ කථාව හොඳට අහගන්න. මේක හරි බරපතල එකක්). මේ චක්ඛු - සෝත - ඝාණ - ජිව්හා - කාය කියන ප්‍රසාද රූප ටික මැරිච්ච ඒවා නොවෙයි. ඒවා හොඳට සජීවීව පවතිනවා. මේ චක්ඛු - සෝත - ඝාණ - ජිව්හා - කාය කියන ප්‍රසාද රූප ටික නොමැරී තිබුණාට මේවා මේ වෙලාවේ ආයතන නොවෙයි. ඒවා ආයතන වෙන්නේ නෑ.

මෙහෙම හිතන්න. මේ කියන විදියට චක්ඛු - සෝත - ඝාණ - ජිව්හා - කාය - මන කියලා හයක් තිබුණාට එක වෙලාවකට වැඩ කරන්නේ මෙයින් එකයි. ඒ වෙලාවට අනිත් පහම off වෙන්න ඕනෑ. Off වෙනවා කියලා කියන්නේ inactive වෙනවා. හැබැයි මැරෙන්නේ නෑ. මැරෙන්නේ නැතුව inactive වෙනවා. එකක් පමණක් active වෙනවා. දැන් මේ වෙලාවේ හැම එක්කෙනාගේම කන active. නාසය, දිව, ශරීරය යමක් අහන වෙලාවට inactive. ප්‍රසාද රූප ටිකනම් හැම වේලාවේම තිබෙනවා. නමුත් මේ වෙලාවේ ආයතනයක් හැටියට ක්‍රියාත්මක වෙන්නේ එකයි.

ඒ කියන්නේ මේ වෙලාවට ආයතනයක් හැටියට ක්‍රියාත්මක වෙන්නේ කන. කන නිසා පහළ වෙනවා සෝත විඤ්ඤාණය. සෝත විඤ්ඤාණය පහළ වෙනකොට පහළ වෙනවා වේදනා සංඥා සංඛාර. එතකොට මේ වේදනා සංඥා සංඛාර ටික පහළ වෙන්නේත් ආයතන වැඩේ කෙරෙන්නේත් එක තැනකයි. ඒ වේලාවට අනිත් ඒවා වැඩ කරන්නේ නෑ.

ඊළඟට මම කථාව නවත්වලා board එක දිහා බලන්න කියනවා. කථාව නැවැත්වූ ගමන් අර ඉස්සෙල්ලා පහළ වෙච්ච සෝත විඤ්ඤාණ නවතිනවා. ඒ බලන වෙලාවට චක්ඛු විඤ්ඤාණය on වෙනවා. එතකොට වේදනාව එනවා සංඥාව එනවා සංඛාරත් තිබෙනවා. ඒ වේලාවට ඒ සියල්ල ආයතනයක් වෙනවා. මේ විදියට මේවා ක්‍රියාත්මක වෙන වෙලාවට පමණක් ආයතන බවට පත්වෙනවා. අනිත් වෙලාවට ප්‍රසාදයක් හැටියට තිබෙනවා.

ඊළඟට අපි කාටහරි කියනවා ඇස් දෙක පියාගෙන මොකකටවත් ඇහුම්කන් දෙන්නේ නැතුව වඩේ එකක් කන්න කියලා. එතකොට සද්ද ඇහෙන්නෙත් නෑ. රූප පේන්නෙත් නෑ. මේ වෙලාවට කෑම කන නිසා ඒ වෙලාවට ආයතනය වෙන්නේ ජිව්හා ආයතනය.

එතකොට වේදනාව සංඥාව සංඛාරය ජිව්හා විඤ්ඤාණය කියන ඔක්කොම ටික ඒ වෙලාවට ජිව්හා ආයතනය වශයෙන් ක්‍රියාත්මක වෙනවා.

දැන් පාන් හැදෙන්න හේතුවෙන්නේ පිටි. ඒ වගේ මේවා ආයතන වශයෙන් ක්‍රියාත්මක වෙන්න හේතුවෙන්නේ නාම ධර්ම සහ රූප ධර්ම. නාම රූප ධර්ම ඒ විදියට සකස් වෙලා තිබුණ නිසා තමයි යම්කිසි වෙලාවක ඒක ආයතන වෙන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අපි ඇස් දෙක වහන් හිටියට නහයෙන් සුවඳ දැනෙනවා වගේ එක අවසථාවකදී ඔක්කොම ක්‍රියත්මක වෙන්නත් පුළුවන් නේද?

<u>පිළිතුර</u> - එක අවස්ථාවකදී කිසිසේත්ම ඔක්කෝම ක්‍රියාත්මක වෙන්න බෑ. ඒක වෙන්නේ නෑ. මේක සරලව කියනවා නම් හුස්මයි උගුරයි වගේ. කොයි වෙලාවකවත් හුස්ම ගන්න ගමන් වතුර බොන්න බෑ. හුස්ම ගන්න කොට ඒ valve එකෙන් පෙනහැල්ල පැත්ත ඇරෙන්න ඕනෑ, කෑම යන පැත්ත වැහෙන්න ඕනෑ. කෑම ගිලින වෙලාවට පෙනහැල්ල පැත්ත වැහෙන්න ඕනෑ, කෑම යන line එක open වෙන්න ඕනෑ. එහෙමයි තිබෙන්නේ. ඒ දෙකම එක වෙලාවක සිද්ධ වෙන්නේ නෑ.

එතකොට මේ නාම ටිකයි රූප ටිකයි එක්කාසුවෙලා මෙහෙම තිබෙන නිසා තමයි යම්කිසි වෙලාවක මේක ආයතනයක් බවට පෙරලිලා වැඩ කරන්නේ. ආයතනයක් කියලා කියන්නේ කට්ටියක් ගිහිල්ලා වැඩ කරන තැන.

උදාහරණයක් ලෙස ගත්තොත් අපි තේ බොන වෙලාවකට නම් ජිව්හා විඤ්ඤාණය ඇතිවෙලා වේදනාවත් එතනට ගිහිල්ලා සංඥා සංඛාර ටිකත් එක්කාසුවෙලා ජිව්හා ප්‍රසාදයේ ගැටිලා ඒ ඔක්කෝම එකතැනකට එකතුවෙලා මණ්ඩලයක් වෙනවා. එතකොට ඒ තමයි ජිව්හා ආයතනය, කෙලෙස් හැදෙන තැන, සංඛාර වැඩ කරන තැන. දැන් ඒ තේ බොන අවස්ථාවට ජිව්හා ප්‍රසාදය ආයතනයක් බවට පත්වෙන්නේ ඒක මැරෙන්නේ නැතුව තිබුණ නිසයි. ඒකට කියනවා **නාමරූප පච්චයා සළායතනං** කියලා.

ඒක අපිට මෙහෙම කියන්නත් පුළුවන්.

.

නාමරූප පච්චයා චක්ඛායතනං
නාමරූප පච්චයා සොතායතනං
නාමරූප පච්චයා ඝාණායතනං
නාමරූප පච්චයා ජිව්හායතනං
නාමරූප පච්චයා කායායතනං
නාමරූප පච්චයා මනායතනං

බුදුරජාණන් වහන්සේ මේ ඔක්කොම එකට එකතු කරලා තමයි **නාමරූප පච්චයා සළායතනං** කියලා දේශනා කරන්නේ.

තව එකක් තිබෙනවා.
දැන් අපි පාන් හදනවානම් හෝ බනිස් හදනවානම් හෝ වෙන මොනවා හරිදෙයක් නිෂ්පාදනය කරනවානම් එයට පදනම් වෙච්ච මූලික වෙච්ච ද්‍රව්‍යාත්මක වෙච්ච දේ තමයි

පිටි. කෑමක් හදන වෙලාවේදී පිටිම විතරක් නොවෙයි, තව ලුණු දානවා තව තව දේවල් දාල ඒවා මිශ්‍ර උනහම තමයි ඒ වැඩේ සිද්ධ වෙන්නේ. එතකොට හොඳට බලන්න, පිටි වශයෙන් තිබෙන කාලයේදී ඒකට පාන් කියලා කියන්න බෑ. පාන් හදලා පෝරණුවේ දාල පිච්චුවට පස්සේ තමයි ඒක පාන් බවට පත්වෙන්නේ. නමුත් පාන් කියලා පාන් නමින් තමයි විකුණන්නේ. මේවා හැදෙන්නේ බේකරියේ. බේකරිය කියන නමින් තමයි යන්නේ. බේකරියේ පාන් කියලා තමයි කියන්නේ. නමුත් බෙකරියත් නෑ පානුත් නෑ පිටි නැත්නම්.

ඒක නිසා පිටි කියන දේ ප්‍රධාන වශයෙන් බේකරියක් ක්‍රියාත්මක වෙන්න උදව් වෙනවා, උපකාර වෙනවා, හේතු වෙනවා. පිටි කියන දේ පාන් හැදෙන්න උදව් වෙනවා, උපකාර වෙනවා, හේතු වෙනවා. පිටි කියන දේ බේකරිකාරය කියලා නාම දාන්න උදව් වෙනවා, උපකාර වෙනවා, හේතු වෙනවා. ඒක නිසා ඔන්න ඔය අර්ථයෙන් තමයි කියන්නේ මේ ප්‍රසාද රූපයෝ ආයතන වෙන්න උදව් වෙනවා, උපකාර වෙනවා කියලා. ඒකට කියනවා **නාමරූප පච්චයා සළායතනං** කියලා.

<u>ප්‍රශ්නය</u> - දැන් මනස කියන එකත් ආයතනයක් නේ. එතකොට අපි හිතින් හිතලා ගන්න වින්දනයට විශේෂිත රූප අවශ්‍ය නැනේ? රූපයක් නැතුව වින්දනයක් ලබන්න පුළුවන්.

<u>පිළිතුර</u> - ඒක වෙන්නේ වෙන විදියකටයි. මනස තිබෙන තැනක් තිබෙනවා. රූපයක් දකින වෙලාවේදී අපේ හිත තැවරිලා ගෑවීලා තිබෙන්නේ ඇස හරියේ. සද්දයක් අහන වෙලාවට හිත ඇවිල්ලා තිබෙන්නේ කන හරියට. ගඳ සුවඳ දැන ගන්න කොට හිත තිබෙන්නේ නාසය ගාව. දිවට රසයක් දැනෙන වෙලාවට හිත එතැනට ගිහිල්ලා තිබෙන්නේ. කයට ස්පර්ශයක් දැනෙන කොට තැනේ හැටියට ඒ ඒ තැනට හිත ගොඩ වෙනවා. මේ කියන්නා වූ තැන් වල තමයි හිත පවතින්නේ.

රූප දැනගන්න කොට හිතට ඉන්න තැනක් තිබෙනවා. සද්ද දැන ගන්නකොට හිතට ඉන්න තැනක් තිබෙනවා ගන්ධයට රසයට ස්පර්ශය හිතට ඉන්න තැන් තිබෙනවා. හිත හිතා ඉන්නකොටත් මහත්මයා හිතට ඉන්න තැනක් තිබෙනවා. ආන්න ඒ රූපයට කියනවා **හෘදය වත්ථු රූපය** කියලා. ඒ රූපය ආධාර කරගෙන තමයි මනෝ විඤ්ඤාණය ඒකට එන්නාවූ අරමුණු දැන ගන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස මනායතනය වගේ ධම්මායතනය තිබෙන තැනක් නැත්ද?

<u>පිළිතුර</u> - ධම්ම කියන්නේ මනසට එන මනෝ ධර්ම.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස මනෝ ධර්ම හැම තිස්සේම ඇතිවෙන්නේ ඉස්සෙල්ලා වෙච්ච සිද්ධියක් සම්බන්ධයෙන්ද මතකයෙන් විතරමද?

<u>පිළිතුර</u> - නෑ, අනාගතය සම්බන්ධයෙන් හිතනවා. අතීතය ගැන හිතෙනවා. අතීතය ගැන හිතනවා. වර්තමානය ගැන හිතනවා. වර්තමානය ගැන හිතෙනවා. ඔය විදියට plan කරනවා. ඉබේ එනවා. එහෙම තිබෙනවා.

නාම ධර්ම රූප ධර්ම එකතුවෙලා ආයතන සකස් වෙනවා කියන කාරණය තමයි අපි මේ පින්වතුන්ට මතක් කළේ. **නාමරූප පච්චයා සළායතනං** කියලා බුදුරජාණන් වහන්සේගේ මූලික දේශනාවේ තිබෙනවා. නමුත් තේරුම් ගැනීම සඳහා අපි ඕක ගොඩවල් හයකට කඩලා ගන්න ඕනෑ. එතකොට තමයි ඕක අපිට හොඳට වැටහෙන්නේ.

එතකොට වෙන්නේ මෙහෙමයි.

නාමරූප පච්චයා චක්ඛායතනං - නාමරූප පච්චයා සොතායතනං - නාමරූප පච්චයා ඝාණායතනං - නාමරූප පච්චයා ජිව්හායතනං - නාමරූප පච්චයා කායායතනං - නාමරූප පච්චයා මනායතනං කියලා ගන්න ඕනෑ.

එහෙම නැත්නම් එකම වෙලාවේ ඇහෙනවා දැනෙනවා පේනවා කියලා අපිට හිතෙනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ජීවිත නවකය කියන්නේ මොකක්ද?

<u>පිළිතුර</u> - ජීවිත නවකය කියලා කියන්නේ ජීවිත ඉන්ද්‍රියත් එක්ක තිබෙන්නා වූ රූප 9ය.

පඨවි +ආපෝ + තේජෝ + වායෝ + වර්ණ + ගන්ධ + රස+ ඕජා + ජීවිත ඉන්ද්‍රිය = 9 යි.

අසංඥ තලයේ ඉන්න අසංඥ සත්වයන්ට කියන්නේ බ්‍රහ්මයෝ කියලා. ඒ ගොල්ලන්ට හිතක් නෑ. ගල් ගෙඩිය වගේ තිබෙනවා. ඒ හිතක් නැති රූප ස්වභාවයක් හැටියට තිබෙන්නා වූ ඒ ශරීරය සත්වයෙක් හැටියට තමයි සලකන්නේ. විඤ්ඤාණයක් නෑ. ඒ රූපය කිසි කෙනෙකුට බෝම්බ ගහලවත් විනාස කරන්න බෑ. එහෙම වෙන්නේ නෑ. ඒ රූපය කාලයක් පවතිනවා.

ඒ රූපයේ පඨවි ආපෝ තේජෝ වායෝ තිබෙනවා. වර්ණ ගන්ධ රස ඕජා ටිකත් තිබෙනවා. ඒ ටික සත්වයෙක් හැටියට ජීවිත ඉන්ද්‍රියක් දාල පවත්වාගෙන යනවා. ඒක මහා කල්ප 500 තිබෙනවා. ඊට පස්සේ ජීවිත ඉන්ද්‍රිය නැතිවෙලා යනවා. ඊට පස්සේ එතනින් අයින්වෙනවා. ප්‍රතිසන්ධි විඤ්ඤාණයක් පහළ වෙන්නේ නැති එකම තැන තමයි අසංඥ තලය.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස පිං කරහම නේද බ්‍රහ්මලෝකයට යන්නේ?

<u>පිළිතුර</u> - ඒකත් පිනක් තමයි. කුසලයක් තමයි. හේතුව එයා භාවනා කරලා තිබෙනවා හිත එපා කියලා. හිතේ අඩුපාඩුවක් තිබෙනවා, හිත එපා කියලා කියපු නිසා හිතක් නැතුව කයක්

හමබවෙනවා. සමහර අය කය එපා කියලා භාවනා කරනවා. එතකොට කය නැතුව හිත පමණක් හම්බවෙනවා.

රූපා වචර බ්‍රහ්මලෝකයේ එක කොටසක් තමයි අසංඥ තලය.

ආනාපාන සති භාවනාව ගැන පසුව කියලා දෙන්නම්. තෙරුවන් සරණයි!

සාධූ !සාධූ! සාධූ!

ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.